**ශීර්ෂය - 261 ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දිස්ත්‍රික් ලෙකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව ස්ථාවර වත්කම් විෂයන් 03 ක පෙර වර්ෂයේ අවසාන ශේෂය හා වර්ෂයේ ආරම්භක ශේෂය අතර රුපියල් මිලියන 303.67 ක වෙනසක් පැවතුණි. | 2020 වර්ෂයේ ශේෂ ඉදිරියට ගෙන ඒමේදී 2019 වර්ෂයේ ආරම්භක ශේෂයන් 2020 වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස සටහන් වීම මෙම වෙනස්කම් වලට හේතු වී තිබුණි. | පෙර වර්ෂයේ අවසාන ගිණුම් ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගත යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂ පිරික්සුම අනුව හා මූල්‍ය ප්‍රකාශන වල අඩංගු මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව විෂයන් 03 කට අදාළව වර්ෂය තුළ අත්පත් කර ගැනීම් හා අපහරණය කිරීම්වල පිළිවෙලින් රුපියල් මිලියන 308.15 ක හා රු.41,062 ක වෙනස්කම් පැවතුණි. | 2020 වර්ෂයේ ආරම්භක ශේෂයන් වශයෙන් 2019 වර්ෂයේ ආරම්භක ශේෂයන් සටහන් කිරීම මෙම වෙනස්කම් වලට හේතු වී තිබුණි. | සියළුම වත්කම් අත්පත් කරගැනීම් හා අපහරණය කිරීම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඇතුළත් කර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය සමග සැසඳිය යුතු වීම. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව මුළු මිලදී ගැනීම් රුපියල් මිලියන 657.31 ක් වුවත් වැය විෂයයන් 03කින් නියෝජනය වන එම එකතුව රුපියල් මිලියන 354.44 ක් වීම නිසා එම ශේෂ අතර රුපියල් මිලියන 302.87 ක වෙනසක් පැවතුණි. | මිලදී ගැනීම් වලට ඇතුළත් විය යුතු රු.3,123,877 ක් ආරම්භක ශේෂයට ඇතුළත් කිරීමත් 2020 වර්ෂයේ මිලදී ගැනීම් වලට 2019 වර්ෂයේ මිලදී ගැනීම් ද එකතු කිරීමත් නිසා මෙම වෙනස සිදු වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් ශේෂ උපලේඛන වල ගිණුම් ශේෂ සමග සමාන විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂයේදී රු.3,255,303 ක් වියදම් කර ඉදිකර තිබූ ගේබියන් රැඳවුම් බැම්මේ කොටසක් පෙරලී හානියට පත්ව තිබුණද එම හානිය තක්සේරු කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | වාර්තාව මේවන විට ලැබී ඇති බවත් ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර ගිණුම් වලට ගැලපීම කළ යුතු වීම. |

**1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක ණය ලේඛනවල ණය ශේෂ (CC 10) හා අත්තිකාරම් ගිණුම අනුව ණය ශේෂ අතර එකතුව රු.1,732,296 ක් වූ නොසැසඳීම් පැවතුණි. | බද්දෙගම හා බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදුවී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු යොදමි. | අදාළ ලේඛන සැසඳිය හැකි පරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.3 අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වංචාවක් හේතුවෙන් කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේ සිදුවී තිබූ රු.194,086 ක් වූ නොපියවූ අග්‍රිම ශේෂය වසර 14 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | නොපියවූ අග්‍රිම ශේෂය කඩිනමින් පියවීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මාස 07 ක් සඳහා ඉල්ලුම්කළ අග්‍රිම වටිනාකමට වඩා සියයට 39 ත් 79 ත් අතර ප්‍රතිශතයකින් අග්‍රිම අඩුවෙන් ද මාස 05 ක් සඳහා සියයට 108 ත් 156 ත් අතර ප්‍රතිශතයකින් අග්‍රිම වැඩියෙන්ද ලැබී තිබුණි. සමස්තයක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ඉල්ලුම් කළ මුළු අග්‍රිමයට වඩා සියයට 88 කින් අග්‍රිම අඩුවෙන් ලැබී තිබුණි. | ඇතැම් අවස්ථාවල පසුගිය මාසයන්හි ඉල්ලීම් ද සලකා බලමින් අග්‍රිම ලබා දෙන අවස්ථා ද ඇති බවත් එවැනි අවස්ථාවන්හිදී අප විසින් ඉල්ලුම් කරන අග්‍රිමය ඉක්මවා යන ලෙස භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලැබෙන බවත් එනිසා මාසිකව ඉල්ලුම් කරන අග්‍රිමයට වඩා අඩුවෙන් අග්‍රිම ලැබීමේ හා මාසිකව ඉල්ලුම් කරන අග්‍රිමයට වඩා වැඩියෙන් අග්‍රිම ලැබීමෙන් විශාල ප්‍රතිශතමය වෙනසක් ඇති වී ඇත. | භාණ්ඩාගාරයෙන් ලැබෙන අක්මුදල්ද සලකා බලා සැලසුම් පිළියෙල කළ යුතු වීම. |

### 2.2 ආදායම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආදායම් සංකේත දෙකක් යටතේ ඇස්තමේන්තු කර තිබුණු ආදායමින් එකතු කළ ආදායම් ප්‍රතිශතය සියයට 16 සිට සියයට 64 ක තරම් අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. | 2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා ලද ආදායම අඩුවී තිබුණි. | ඇස්තමේන්තුගත ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) ආදායම් විෂයන් 8 කට අදාළව පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ආදායම් එකතු කිරීම්වල සියයට 9 සිට සියයට 90 ක ප්‍රතිශතයකින් ආදායමේ අඩුවීමක් විය. | -එම- | -එම- |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාම ගිය නිලධාරීන් 17 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු.758,762 ක් වූ අතර ඉන් රු.101,628 ක ණය ශේෂයක් වසර 07 ක කාලයක සිට අය විය යුතුව තිබුණි. | 2021 අප්‍රේල් 30 දිනට රු.755,144 ක ණය ශේෂයක් අයවී ඇති අතර රු.705,462 ක ණය ශේෂයක් තවදුරටත් අයවීමට ඇත. | අය විය යුතු ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක වැඩ තහනම් කර තිබූ නිලධාරීන් තිදෙනෙකුගෙන් තවදුරටත් අයකරගත යුතු රු.108,248 ක් වර්ෂ 02 සිට 04 ක කාලයක සිට අය නොවී පැවතුණි. | රු.108,248 ක ණය ශේෂයක් තවදුරටත් අයවීමට තිබේ. | වැඩ තහනම්කර ඇති නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වීම. |
| (ඇ) | නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරියෙකුගෙන් අය විය යුතු ණය ශේෂය රු.136,665ක් වූ අතර එම ණය ශේෂය වර්ෂ 4 ක කාලයක සිට අය නොවී පැවතුණි. | ණය ශේෂය හා පොළිය ඉදිරියේදී මාසිකව අයකර ගැනීමට කටයුතු කරමි. | අදාළ නිලධාරියාගෙන් අය විය යුතු ණය ශේෂය අය කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වීම. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයට අදාළ 2021 ජනවාරි මාසයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙවා තිබුණු එකතුව රු.263,148 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී සියලුම බැරකම් සිගාස් පරිගණක වැඩසටහනට ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | බැදීම් හා බැරකම් ලෙස හදුනාගතහැකි සියලුම ගනුදෙනු එම ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක ගොඩනැගිලි ඉදි කිරීමට අදාළව එකතුව රු.1,805,459 ක් වූ 2020 දෙසැම්බර් බිල්පත් සඳහා 2021 ජනවාරි මාසයේදී ගෙවීම් කර තිබුණු බැවින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම රු.1,783,485 ක් විය. | ගෙවීම් කිරීමට ප්‍රතිපාදන නොලැබීම නිසා බැරකම් වලට ඇතුළත් නොකරන ලදී. | බැදීම් හා බැරකම් ලෙස හඳුනාගතහැකි සියලුම ගනුදෙනු එම ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.5 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් ගෘහ ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා වූ ජාතික ගෙවතු වගා වැඩසටහන 2020/2021 යටතේ ලැබී තිබූ ප්‍රතිපාදන වලින් රු.2,201,203 ක් උපයෝජනය කර නොතිබුණි. | 2020 දෙසැම්බර් මස 08 දින ප්‍රතිපාදන ලැබුනු බැවින් ප්‍රතිපාදන උපයෝජනය සඳහා කාලය ප්‍රමාණවත් නොවීම. | කල්වේලා ඇතුව ප්‍රතිපාදන ලබාගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

## 2.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම හා ඒ අනුව විගණනය කර පිළියෙල කරනු ලබන අභ්‍යන්තර විගණන විමසුම් විගණකාධිපතිවරයා වෙත යොමු කර ඇති අතර වාර්ෂිකව පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා ද විගණකාධිපතිවරයා වෙත යොමු | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | |
|---|---|
| බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි . | කර ඇති බව ද තවදුරටත් දන්වමි. |

## 2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

**නිරීක්ෂණය**

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ<br>(i) මුදල් රෙගුලාසි 104 (4) | වාහනවලට 2001 වර්ෂයේ එක් අනතුරක්ද, 2018 වර්ෂයේ අනතුරු 3 ක්ද, 2020 වර්ෂයේ අනතුරු 3 ක්ද සිදුවී තිබූ අතර එම අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවසන් වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අවසන් වාර්තා ඉදිරිපත් කර නොමැති අනතුරු සඳහා වාර්තා මෙම වර්ෂයේදි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) මුදල් රෙගුලාසි 1645 (ආ) 1646 (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත දිස්ත්‍රික් සමෘද්ධි අංශය සතු කැබ් රථ දෙකකට අදාළව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් 2020 මැයි සිට දෙසැම්බර් දක්වා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය මත දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය වෙත පැවරී තිබූ රාජකාරි බහුලතාවය නිසා ධාවන සටහන් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී ඇත. | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සිටින කාර්යමණ්ඩල පිළිබඳ විස්තර, අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය, වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්, ප්‍රසම්පාදන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුලත් වන පරිදි | අදාල සැලැස්ම සකස්කර අමාත්‍යාංශයෙන් ලද උපදෙස් අනුව 2020 පෙබරවාරි 12 දින ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් වර්ෂය ආරම්භ වීමට ප්‍රථම සකස් කළ යුතු වුවද, එම සැලසුම 2021 මාර්තු 08 දින ප්‍රමාද වී විගණනයට ඉදිරිපත් කර තිබුණි. | | |
| (ඇ) (i) 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යංශ චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 කට අදාළව නිලධාරීන් 06 දෙනෙකු ඉහත චක්‍රලේඛ උපදෙස් පරිදි අනුමැතිය ලබා නොගෙන 2020 ජනවාරි හා පෙබරවාරි මාසවලදී පමණක් දින 22 ක් සඳහා නිවාඩු දින වැටුප් ලබාගෙන තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි රජයේ නිවාඩු දිනවල රාජකාරී ඉටු කිරීමේදී පූර්ව අනුමැතිය, දිස්ත්‍රික් ලේකම් වෙතින් ලබා ගන්නා ලෙසට අදාළ ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කිරීමට කටයුතු කරමි. | -එම- |
| (ii) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(1) ඡේදය | චක්‍රලේඛයේ උපදෙස් පරිදි මාණ්ඩලික නිලධාරීන් ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් පැමිණීම පිටවීම සනාථ කර නොතිබුණි. | ක්ෂේත්‍ර රාජකාරී සිදුකරන අවස්ථා වලදී ධාවන සටහන් මඟින් පැමිණීම හා පිටවීම තහවුරු කර ඇත. | -එම- |

## 2.8 අවිධිමත් ගනුදෙනු

(අ) 2017 වර්ෂයේ ගංවතුරින් ආපදාවට ලක්වූ දේපල සඳහා වන්දිගෙවීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i)** 2017 වර්ෂයේ සිදුවූ ගංවතුරින් ආපදාවට ලක්වූ දේපල සඳහා වන්දි ගෙවීමට අදාළ කර ගතහැකි පරිදි වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් චක්‍රලේඛ දෙකක් නිකුත් කර තිබුණි. එක් චක්‍රලේඛයක් 2018 මැයි දින රහිතව නිකුත් කර තිබුණු අතර එම චක්‍රලේඛයට අදාළව ආපදාවට ලක් වූ දේපල වෙනුවෙන් රු.100,000 ක උපරිම වන්දි මුදලක් ගෙවිය හැකිව තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වන්දි ගෙවීම සඳහා අදාළ කරගෙන තිබුණු චක්‍රලේඛය 2017 ජුනි 05 දින නිකුත් කර තිබුණු අතර එම චක්‍රලේඛයට අදාළව රුපියල් මිලියන 2.5 ක උපරිම වන්දි මුදලක් ගෙවිය හැකිව තිබුණි. ඒ අනුව එම චක්‍රලේඛය උපයෝගී කර ගෙන නාගොඩ | 2017 මැයි මස ගංවතුර ආපදාවෙන් හානි වූ දේපළවලට අදාළව වන්දි ගෙවීම සඳහා 261-1-1-0-2509 වැය ශීර්ෂයෙන් අප වෙත ප්‍රතිපාදන ලැබී තිබුණි. ආපදා කළමණාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක NDRSC/01/04/01/2017 හා 2017.06.05 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් අනුව 261 වැය ශීර්ෂයේ ගණන් දීමේ නිලධාරී විසින් නිකුත් කර ඇති අංක DSG/SVC/12 /39-2018 හා 2018.06.08 දිනැති උපදෙස් ලිපිය මගින් 2017 මැයි මස ආපදා තත්ත්වයෙන් හානි වූ | එකම කරුණක් සම්බන්ධයෙන් චක්‍රලේඛ දෙකක් නිකුත් කිරීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සිදු කර තිබුණු වන්දි ගෙවීම හේතුවෙන් රු.100,000 කට වඩා වැඩියෙන් වන්දි ගෙවා තිබුණු ව්‍යාපාරිකයින් සංඛ්‍යාව 122 ක් වූ අතර ගෙවා තිබුණු මුදල රුපියල් මිලියන 56.98 ක් විය. මෙසේ එකම කරුණක් සම්බන්ධයෙන් චක්‍රලේඛ දෙකක් නිකුත් කර තිබීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළ යුතුව තිබුණි. | දේපළ සඳහා වන්දි ගෙවීමට කටයුතු කර ඇත. | |
| **(ii)** | වෙන්වෙන්ව ව්‍යාපාරික ස්ථාන දෙකක් පවත්වාගෙන ගිය බවට පිළිගතහැකි ලිඛිත සාක්ෂි නොතිබියදී එකම ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන ගොස් තිබූ ස්වාමිපුරුෂයා හා බිරිඳ යන දෙදෙනාටම පිළිවෙලින් රු.2,000,000 ක් හා රු.1,521,000 ක් වශයෙන් එකතුව රු.3,521,000 ක වන්දි ගෙවා තිබුණි. | කාර්යාලයීය ව්‍යාපාර නාම ලියාපදිංචි ලේඛනය අනුව ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන නොමැති නමුත් බොහෝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ පැවති වෙළඳ ආයතන දෙකක් බව නිරීක්ෂණය වූ බැවින් අලාභය ගෙවීම් කර ඇත. | වන්දි ගෙවීමට ප්‍රථම අදාළ තහවුරු කර ගැනීමේ සාක්ෂි සියල්ල ලබාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතු වේ. |
| **(iii)** | ගංවතුරින් හානි වූ දේපලවලට වන්දි ගෙවීම් යටතේ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියට අදාළව ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් රු.243,000 ක් වන්දි ලෙස ඉල්ලීම් කළ පුද්ගලයෙකුට රු.1,266,587 ක් වැඩිපුර වන්දි ගෙවා තිබුණි. | සාමාන්‍ය පුරවැසියන්ට තක්සේරු කිරීම පිළිබඳ අවබෝධයක් නොමැති බව දන්වා තිබුණු අතර හානි ප්‍රතිපූර්ණය කිරිමට පදනම් කරගනු ලබන්නේ ජා.ආ.ස.සේ.ම 9(V) ආකෘතිය එබැවින් කිසිඳු වැඩිපුර ගෙවීමක් සිදු කර නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව ලබාදී ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| **(iv)** | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගංවතුර වන්දි මුදල් ගෙවීමෙන් පසුව රුපියල් මිලියන 51.34 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මෙම ඉතිරි මුදල් සම්බන්ධයෙන් එක් එක් අයදුම්කරු ඉල්ලුම්කර තිබුණු මුදල, නිර්දේශ කළ මුදල, අයදුම්කරු පිළිබඳ විස්තර හා වන්දි මුදල් නොගෙවීමට හේතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් රැස්කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අතිරේක ප්‍රතිපාදන ලැබෙන විට ජාතික රක්ෂණ භාර අරමුදලින් වන්දි පූර්ණයන් කිරීමට කටයුතු කර තිබුණු බැවින් මහා භාණ්ඩාගාරය වෙතින් ලද ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 51 ක් ඉතිරිවී ඇත. | අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |
| **(ආ)** | ප්‍රාදේශීය ලේකම්වරුන් 05 දෙනෙකු විසින් මසකට දින 20 ඉක්මවා ක්ෂේත්‍රගත රාජකාරි සිදුකර ඒ සඳහා දීමනා ලබාගෙන තිබූ බැවින් එම නිලධාරීන් ඇතැම් මාසවල කාර්යාලගත රාජකාරී වලට වඩා බැහැර රාජකාරි සිදුකර තිබුණි. | අත්‍යවශ්‍ය රාජකාරි සඳහා බැහැර රාජකාරි සිදු කර ඇති බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක් විසින් මසක් තුළ බැහැර රාජකාරී කළ ශුද්ධ දින ගණන 20 ට අඩුය. | කාර්යාල රාජකාරිවලට බාධා නොවන පරිදි ක්ෂේත්‍ර රාජකාරි සිදු කළ යුතුය. |

## 2.9 තැන්පත් ශේෂයන්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------------- | ------------ |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් තුනකට අදාළ වර්ෂ 2 ත් 5 ත් අතර හා අවුරුදු 5ට වැඩි නිරවුල් කර නොතිබුණු ගිණුම් ශේෂ වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 93.81 ක් සහ රුපියල් මිලියන 199.37 ක් විය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගණන් දීමේ නිලධාරිගේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | පොදු තැන්පත් ගිණුමේ අවුරුදු 5 ට වැඩි ශේෂයන්ගෙන් එකතුව රුපියල් මිලියන 169.8 ක් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති 102 ක රැඳවුම් මුදල් ශේෂයන් වූ අතර එම ව්‍යාපෘතිවලට අදාළ කොන්ත්‍රාත් ආයතන සම්බන්ධයෙන් පසු විපරම් කර එකී වැඩ අවසන් කරවාගෙන රැඳවුම් මුදල් නිදහස් කිරීමට හා ව්‍යාපෘති වල ප්‍රතිලාභ අත්කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සමාන්‍යාධිකාරි වෙත දැනුම් දී ඇත. | දීර්ඝ කාලයක සිට වැඩ අවසන් කර නොමැති මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් කඩිනමින් පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන රැඳවුම් මුදල් නිදහස් කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | උක්ත තැන්පතු ගිණුම් අතරින් තවත් ගිණුමකට අදාළව වර්ෂ 5 ඉක්මවූ රු.230,214 ක් වූ තැන්පතු ශේෂ 04 ක් සම්බන්ධයෙන් හා වර්ෂ 2ත් 5 ත් අතර වූ රුපියල් මිලියන 23.94 ක් වූ තැන්පතු ශේෂ 44 ක් සම්බන්ධයෙන් විගණන විමසුම් නිකුත් කර තිබූ අතර එකී විගණන විමසුම්වල දක්වා තිබූ අඩුපාඩු නිවැරදි කර එම තැන්පතු නිදහස් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද කටයුතු කර නොතිබුණි. | එම විගණන විමසුම් සම්බන්ධයෙන් මේවන විට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබමින් සිටින අතර රැඳවුම් මුදල් කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කරගෙන යනු ලබන බව දන්වමි. | කල් ඉකුත් වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කඩිනමින් සුදුසු පියවර ගත යුතු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 103.28 ක් වූ ව්‍යාපෘති 200 ක් විවිධ හේතූන් මත නිම නොකර අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘති යෝජනා වැඩි කොටසක් අනුමත කරනු ලැබූයේ 2019 වර්ෂයේ මැද භාගයේදී බවත් 2019 වර්ෂයේ නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණය හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාව ලබා දුන් උපදෙස් මත සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබා දුන් උපදෙස් පරිදි සහ අයහපත් කාලගුණය, ව්‍යාපෘති ඉටුකිරීමට සමිති ඉදිරිපත් නොවීම, මැතිවරණ කටයුතු ආදිය හේතු වී තිබුණි. | කාර්යක්ෂමව කටයුතු කර සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර ගත යුතු වීම. |
| (ආ) නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැවති අයහපත් කාලගුණය නිසා විපතට පත් ජනතාව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.200,000 බැගින් එකතුව රුපියල් මිලියනයක මුදලක් ලබාදී තිබුණු ප්‍රතිලාභීන් 10 දෙනෙකු තම නිවාස ඉදිකිරීම් අතරමඟ නවතා දමා තිබුණි. | ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**--------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ---------------------------------------- | ----------- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පැවති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් මගින් 2020 වර්ෂයේ විවිධ වැඩසටහන් යටතේ ව්‍යාපෘති 1812 ක් ඉටු කර තිබුණු අතර එකී ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 494 ක වැඩ අවසන් කිරීමට දින 1 ත් මාස 07 ත් අතර කාලයක් ප්‍රමාද වී තිබුණි. තවද එකී ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 472.1 ක් ගෙවා තිබුණු අතර ප්‍රමාද වූ ව්‍යාපෘතිවල ප්‍රතිශතය මුළු ව්‍යාපෘති ගණනික් සියයට 27 ක් විය. එකී ප්‍රමාද වූ ව්‍යාපෘති කිසිවක් සඳහා ප්‍රමාද ගාස්තු අය කර ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් විමසා ඉදිරියේදි පිළිතුරු ලබාදීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රමාද වූ ව්‍යාපෘති වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අඩු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

**----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ---------------------------------------- | ----------- |
| (අ) 2020 වර්ෂය සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලේ ප්‍රදාන යටතේ වූ කෘෂි ව්‍යාපෘති 08 ක් සඳහා රු.3,899,885 ක් ඇස්තමේන්තු කර තිබුණද, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් ක්‍රියාත්මක කිරීම සිදු නොවුණි. | අදාළ ආයතනය මගින් ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුව තිබුණි. තවද ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සඳහා දරා තිබුණු පිරිවැයට ආර්ථික වටිනාකමක් ලබා දිය යුතුව තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හරිත කෘෂි උද්‍යානයක් ස්ථාපිත කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,500,000 ක යෝජනාවක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | හරිත කෘෂි උද්‍යානයක් ස්ථාපිත කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අතර ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | -එම- |
| (ඇ) | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කින් කෘෂි ව්‍යාපෘති 13 ක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රු.3,153,015 ක ප්‍රතිපාදන ඉල්ලීම් කර තිබුණද අදාළ ප්‍රතිපාදන නොලැබීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | එම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නොලැබුණු බැවින් ක්‍රියාත්මක කර නැත. | -එම- |
| (ඈ) | ප්‍රදේශයේ කාබනික ගොවිතැන ප්‍රවර්ධනය සඳහා කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට ඇති විභව හා ගැටළු ඇතුළත් වාර්තාවක් ලබාදෙන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් දන්වා තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දිස්ත්‍රික්කයට අදාළ ව්‍යාපෘති යෝජනාවක් රු.12,192,470 ක ඇස්තමේන්තුගත වටිනාකමක් යටතේ ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහාද 2020 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | ප්‍රතිපාදන වෙන් නොකළ බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි විය. | -එම- |
| (ඉ) | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති 2019 මැයි 29 දින රැස්වීම් කමිටුවේ වාර්තාව අනුව වන සතුන්ගෙන් සිදුවන ගැටළු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග වශයෙන් වායු රයිපල් මඟින් වන සතුන් පලවා හැරීම ඇතුළුව කරුණු 06 ක් සාකච්ඡාකර තිබුණද 2020 දෙසැම්බර් 31 දක්වා එම කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම කාර්යයන් ආරක්ෂක අමාත්‍යාංශය හා කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී අමාත්‍යාංශය හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ඉටු කිරීමට ප්‍රමුඛව කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශ ලේකම් වරයාගේ තීරණ ක්‍රියාත්මක කිරීමට ගණන් දීමේ නිලධාරීන් කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කෘෂිකාර්මික ප්‍රදේශවල වගාවන්ට හානි සිදු කරනු ලබන වන සතුන්ගෙන් වන හානි අවම කිරීම සඳහා තිරසර වැඩපිළිවෙලක් සකස් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් තොරතුරු කැඳවා තිබුණු අතර ඒ සඳහා සවිස්තරාත්මක වාර්තාවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. නමුත් එම ගැටළු සම්බන්ධයෙන් තිරසර වැඩපිළිවෙලක් මේ දක්වා සකස් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන බවත් මෙහි වගකීම් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වෙත පවරා ඇති බවත් ඊට අදාල ක්ෂේත්‍රගත තොරතුරු කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යවා ඇත. | කෘෂිකාර්මික ජනතාව වෙනුවෙන් තිරසර තීරණ ගත හැකි දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් වලට පමණක් සීමා නොකර එම තීරණ ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කළ යුතු වීම. |
| (උ) | ශ්‍රවණාගාරය ඉදිකිරීම් පරීක්ෂාව | | |
| | ශ්‍රවණාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2019 ජනවාරි 30 ආරම්භ කර දින 720ක් එනම් 2021 ජනවාරි 30 වන විට අවසන් කළ යුතුව තිබුණි. නමුත් 2019 හා 2020 වර්ෂවල ලද ප්‍රතිපාදන රුපියල් මිලියන 564.5 කින් රුපියල් මිලියන 501.54 ක් හෙවත් සියයට 89 ක් පමණක් උපයෝජනය කර ගෙන තිබුණ නමුත් 2021 අප්‍රේල් 15 දක්වාම ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 18.45 ක මට්ටමේ පැවතුණි. | නව සැලසුම් සකස් කිරීමට සිදුවූ බවත් එමනිසා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සිදු කරන ලද බවත් දන්වා තිබුණි. 2019 හා 2020 වර්ෂවල ලද ප්‍රතිපාදන රුපියල් මිලියන 564.5 කින් රුපියල් මිලියන 501.54 ක් වියදම් කර ඇති බවත් රුපියල් මිලියන 62.95 ක් අතැති බිල් පියවා ඇත. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු අතර එසේ නොවන අවස්ථාවල ගිවිසුමේ සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| | ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සපිරි ගමක් සංවර්ධන වැඩසටහන යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රු.1,000,000 ක් වූ මකුළුව, නො.29 පළමු පටුමගෙහි ඉදිකර තිබුණු පැති | මේ ගැටළුව සම්බන්ධයෙන් 2020.12.24 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ද සාකච්ජා වූ අතර | ශක්‍යතා අධ්‍යනය විධිමත්ව සිදුකර සෞඛ්‍ය ගැටළු ඇති නොවන ආකාරයට ව්‍යාපෘතිය සම්පූර්ණ |

| | | | |
|---|---|---|---|
| | කාණුව, ජලය අවසානයට බැසයන ඇල මාර්ගයට සම්බන්ධ වන ආකාරය නිවැරදි මට්ටම් (Level) ගෙන සම්පූර්ණ කර නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය සෞඛ්‍ය ගැටළු රාශියක් ඇති කරන අසම්පූර්ණ ව්‍යාපෘතියක් වී තිබුණි. | නගරාධිපති තුමා විසින් ඉතිරි ව්‍යාපෘති කොටස සම්පූර්ණ කර පැන නැගී ඇති ගැටළුව විසඳන බවට පොරොන්දු වී ඇත. | කළ යුතු වේ. |
| (ආ) | නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>------------------------------------------- | | |
| (i) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කර තිබුණු ජල ව්‍යාපෘති 03 ක් සඳහා රු.1,844,819 ක් ගෙවා තිබුණද ඒවායේ ජලය පානය කිරීමට සුදුසු භෞතික ගුණාත්ව තත්ත්වයක නොපැවති අතර ව්‍යාපෘති තුනම ජල නල එලා වැඩ අවසන් කර නොතිබුණි. | ජලයේ බැක්ටීරියා ඉවත් කර ගැනීම සඳහා සුදුසු ජීවාණුහරණ ක්‍රමයක් අනුගමනය කිරීම මගින් විසඳා ගත හැකි අතර ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා ඇත. | ජලයේ පානය කිරීමට සුදුසු ප්‍රමිතිගත තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර ජලනල එලා ව්‍යාපෘතීන් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වේ. |
| (ii) | උක්ඹිවිට උතුර ග්‍රාම නිලධාරී වසමේ ස්වයංරැකියා පුහුණු මධ්‍යස්ථානය සඳහා 2020 සැප්තැම්බර් 01 දින වන විට රු.1,481,318 ක් වියදම් දරා අර්ධ වශයෙන් වැඩ අවසන් කර තිබුණු අතර විගණිත දිනය වූ 2021 පෙබරවාරි 05 දක්වාම ගොඩනැගිල්ල ඌණ උපයෝජිතව තිබුණි. | මේ වන විට වැඩ අවසන් කර ඇති බවත් මෙම ස්ථානයේ ස්වයං රැකියා කිහිපයක්ම සිදු කිරීමට අදාළ පුහුණු වැඩසටහන් ආරම්භකර ඇත. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව ආර්ථිකමය වාසි වැඩි ව්‍යාපෘති තෝරාගත යුතු වේ. |
| (ඇ) | නායයාම් අධි අවදානම හේතුවෙන් ඉවත්කිරීමට නිර්දේශවූ ප්‍රතිලාභීන් අතරින් 04 දෙනෙකු සඳහා නිවාස ඉදි කර ගැනීමට එකතුව රු.4,708,605 ක් ගෙවා තිබුණි. නමුත් 2021 අප්‍රේල් දක්වාම ඉහත ප්‍රතිලාභීන් ආපදාවට ලක්වූ නිවසෙහිම පදිංචිව සිට තිබුණි. | ප්‍රතිලාභීන්ගෙන්, ආපදාවට ලක්වන ස්ථානයෙන් ඉවත් වන බවට සහ වෙනත් කිසිවෙකු එම ස්ථානයේ පදිංචි නොකරන බවට ප්‍රකාශයක් ලබාගෙන වාරික නිදහස් කිරීම සිදුකර ඇති බව දන්වමි. | ආපදාවට ලක්වීමට ඇති අධි අවදානම් සහිත ස්ථානවලින් අදාළ පවුල් ඉවත්කර නව නිවාස වල පදිංචි කරවීමට කඩිනම් පියවර ගත යුතු වේ. |
| (ඈ) | නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස ඉදිකිරීම් සඳහා ලබා දී තිබුණු මුදල ප්‍රමාණවත් නොවීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරයා දැනුවත් කර තිබුණද එම ගැටළු සඳහා 2020 දෙසැම්බර් 31 දක්වාම ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග පිලිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම් දැනුවත් කර ඇත. | ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉදිරිපත් කර තිබුණු කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනය වෙත ලබාදිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2020 මූල්‍ය ප්‍රකාශන අනුව හෝල් ඩී ගෝල් ශාලාව සඳහා 2020 වර්ෂයේ වියදම රු.3,772,905 ක් සහ එහි ආදායම රු.1,462,300 ක් වී තිබූ බැවින් ආදායම ඉක්මවූ වියදම රු.2,310,605 ක් වී තිබුණි. | රටතුල කොවිඩ් 19 වෛරසය පැතිරයාම හේතුවෙන් හෝල් ඩී ගෝල් ශාලාවෙහිද වැඩසටහන් පැවැත්වීම සඳහා ශාලාව වෙන්කර ගැනිමට මහජනතාව අයදුම් නොකළ බැවින් එම ඉලක්කගත ආදායම උපයා ගැනීමට නොහැකිවී ඇත. | ඉලක්ක කර තිබුණු ආදායම් මට්ටම කරා ලඟා වීමට උපාය මාර්ග යෙදිය යුතු අතර වියදම් අවම කර ගැනීමට ද කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදනයන්**

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2020 අවසන් කාර්තුවේදී මිලදී ගෙන තිබුණු රු.43,500 ක් වටිනා භාණ්ඩ අයිතම 2 ක් වෙනුවෙන් 2021 පෙබරවාරි 05 දින වන විටත් ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් විසින් ලිඛිත අනුමැතිය ලබා දී ඇති අතර, එම ලිපිය ප්‍රමාද දෝෂයක් හේතුවෙන් මෙම කාර්යාලයට විගණන දිනය වන විට ලැබී නැත. | ප්‍රසම්පාදන කටයුතු වලදී අවශ්‍ය පරිදි පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ. |

**3.6 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ කපා නොහල ඉදිරියට ගෙන ආ යුතු නිවැරදි ශේෂයන්ගේ එකතුව රු.2,847,291 ක් වූ අතර අවුරුදු 19 ක් වූ රු.130,168 ක ශේෂයක්ද අවුරුදු 7 ක් වූ රු.626,171 ක ශේෂයක්ද ඇතුළුව අලාභ හානි 9 ක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි. | මෝටර් රථ අනතුරට අදාළව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වත්කම්වලට සිදුව ඇති අලාභය වන රු.1,403,904 ක මුදල පොත් වලින් කපා හැරීම සඳහා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. අංක 12 රම්පාට් වීදිය පිහිටි රජයේ නිල නිවසට සිදුවූ රු.626,171 ක හානිය කපා හැරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් උපදෙස් ඉල්ලා ඇත. SPPB 4826 රථ අනතුර හා අංක SPPC 2079, | හානි හා පාඩු සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | SPPD 4258 රථ අනතුරු මෙන්ම WPPA 3817 රථ අනතුරෙන් වූ අලාභ මුදල් රෙගුලාසි 104 (4) අනුව ගත යුතු ක්‍රියාමාර්ග මෙම වර්ෂයේදී අවසන් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. | |
| (ආ) | 2020 වර්ෂය තුළදී වාහන අනතුරු 4 ක් සිදුවී තිබුණු අතර ඒ සඳහා එකතුව රු.394,250 ක් අලුත්වැඩියා වියදම් වශයෙන් ගෙවා තිබුණි. කෙසේ නමුත් එම අනතුරු අතුරින් 2 ක් සඳහා එකතුව රු.243,300 ක් වූ හානි ප්‍රතිපූර්ණය කර ගැනීමට 2021 අප්‍රේල් 30 වන විටත් කටයුතු කර නොතිබුණි. | අංක SPPC 4549 දරන රථයේ අලාභය 2020 වර්ෂය අවසානය වන විට නිරවුල් කර තිබුණු බවත් අංක SPPD 4258 රථ අනතුර, WPPA 3817 රථ අනතුර සම්බන්ධයෙන් 2021 වර්ෂයේදී අලාභ ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කරමි. | හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.7 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්මාර්ට් ශ්‍රී ලංකා ප්‍රාදේශීය ඒකක පිහිටුවීම සඳහා කරන්දෙණිය හා ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පරිගණක යන්ත්‍ර 04 ක් ලබා දී රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීමට සැලසුම්කර ඒ පිළිබඳව අදාළ නිලධාරීන් පුහුණුකර තිබුණ ද එම කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. | සැලසුම් කර තිබූ පරිදි ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මහා භාණ්ඩාගාර ඒකාබද්ධ කළමනාකරණ පද්ධති වැඩසටහන යටතේ කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් අමාත්‍යාංශය මගින් 2018 නොවැම්බර් 11 දින පරිගණක 06 ක් ලබා දී තිබුණද 2021 අප්‍රේල් 30 දින දක්වාම වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එම පරිගණක සඳහා දරා තිබුණු වියදම අනාර්ථික වී තිබුණි. | මහාභාණ්ඩාගාර ඒකාබද්ධ කළමනාකරණ පද්ධති වැඩසටහන කඩිනම්ව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. | භාණ්ඩාගාර ලේකම් වරයාගේ උපදෙස් පරිදි අදාළ ව්‍යාපෘතිය කාර්යක්ෂමව ක්‍රියාවට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් නොමැති ජනතාවට ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ බෙදාහැර තිබූ ඉඩම් වෙනුවෙන් අදාල ප්‍රතිලාභීන් වෙත ලබාදීමට පිළියෙල කරන ලද දීමනා පත්‍ර 445 ක්, බෙදා දීමට නොහැකිව වර්ෂ 38 ක කාලයක සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි රඳවාගෙන තිබුණි. එම දීමනා පත්‍ර ජනාධිපතිවරයා විසින් 1982 – 2009 අතර කාලච්ඡේදය තුළදී අත්සන් කර තිබුණ අතර දීමනා පත්‍ර 02 ක් අත්සන් කර නොතිබුණි. ඉහත දීමනා පත්‍ර අතුරින් දීමනා පත්‍ර 142 ක් ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබූ අතර දීමනා පත්‍ර 303 ක් ලියාපදිංචි කිරීමේ කටයුතුද සිදුකර නොතිබුණි. | දීමනාපත්‍රකරුවන් ඉදිරිපත් නොවීම මෙම දීමනාපත්‍ර සම්බන්ධව කටයුතු කිරීමට ගැටළුවක් වී ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් ඇති දීමනා පත්‍ර සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ 1987 හා 1997 කාලපරිච්ඡේදය තුළ දීමනාපත්‍ර ලාභීන්ට බෙදාදිය නොහැකිව දීමනා පත්‍ර 384 ක් කාර්යාලයේ රඳවාගෙන තිබුණු අතර ඒ අතුරින් දීමනාපත්‍ර 26 ක් නිසි අධීක්ෂණයක් නොමැති වීම හා වෙනත් කළමනාකරණ දුර්වලතාවයන් හේතුවෙන් දෙවරක් සකස් වී තිබුණි. තවද 1987 සිට 1997 කාලපරිච්ඡේදය තුළ නිකුත් කර තිබුණු දීමනාපත්‍ර 14 ක් 2021 පෙබරවාරි 05 දක්වාම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. | කෙටි කලකින් විසඳුම් ලබා දීමට අපහසු දීමනාපත්‍ර සම්බන්ධයෙන් මෙම වසර අවසාන වීමට පෙර කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් බලපත්‍ර 9 ක් ප්‍රතිලාභීන් වෙත කඩිනමින් ලබාදීමටත් කොවිඩ් තත්ත්වය හේතුවෙන් කාර්යයන් කිරීමේ ප්‍රතිශතය අඩුවී ඇති බවත් තවදුරටත් දන්වමි. | බෙදා දී නොමැති දීමනා පත්‍ර වල ඌණතාවයන් සම්පූර්ණකර ප්‍රතිලාභීන්ට බෙදා දීමට ක්‍රියා කළ යුතු අතර ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉටුකළ යුතු කාර්යයන් සතුටුදායක ප්‍රතිශතයකින් ඉටු කළ යුතු වේ. |
| (ඇ) | 2015 පෙබරවාරි 11 දිනැති අංක 05/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කරන ලද විශ්‍රාම වැටුප් විස්තරය ලැබී නොතිබීම මත නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් ගෙවනු ලබන නිලධාරීන් 12 | අදාළ සංශෝධනයන් කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇති බව දන්වමි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය උපදෙස් ලබාගෙන ලිපිගොනුවල ඌණතාවයන් සම්පූර්ණකර විශ්‍රාම |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකුගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමට 2021 අප්‍රේල් 30 දක්වාම නොහැකිව තිබුණි. | | වැටුප් සංශෝධනය කිරීමටඅවශ්‍ය පියවර ගත යුතු වේ. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු සංචිත වාහන 28 ක් වෙනුවෙන් රියදුරු වැටුප් හා දීමනා හැර නඩත්තු වියදම් රුපියල් මිලියන 14.47 ක් දරා තිබුණු අතර ධාවනය කළ කිලෝ මීටර් සංඛ්‍යාව 678,097 ක් විය. ඒ අනුව කිලෝමීටරයක වියදමේ සාමාන්‍යය රු.21 ක් වුවද එකිනෙක වාහනවල කිලෝමීටරයක වියදම රු.8 ත් රු.290 ත් අතර විචලනයක් දැක්වුනි. | දක්වා ඇති සංචිත රථයන්හි කිලෝමීටරයකට වියදම රු.21 වඩා ඉහළ ගොස් ඇත්තේ ප්‍රධාන අලුත් වැඩියාවන් සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වීම බව නිරීක්ෂණය වන බවත්, එම රථයන් සියල්ල වසර 10 කට වඩා පැරණි රථයන් බව නිරීක්ෂණය කරන බවත් දන්වා තිබුණි. තවද ඉහත රථයන්හි සියළු අළුත් වැඩියාවන් මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශ මත සිදු කර ඇත. | වාහන නඩත්තු වියදම් අවම කර ගැනීමටත් කටයුතු කළ යුතු අතර ධාවනය කරන කිලෝමීටරයට වියදම විශාල විචලතාවයක් ඇති නොවන ආකාරයට නඩත්තු වියදම කළමනාකරණය කරගත යුතු වේ. |
| (ඉ) | සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින්ම දහම් පාසල් ගුරුවරුන් සඳහා සෑම වර්ෂයකටම නිල ඇඳුම් නොමිලේ ලබා දිය යුතුව තිබුණි. නියදි පරීක්ෂාවට අනුව නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව 2019 සහ 2020 වර්ෂවල පිළිවෙලින් දහම් පාසල් ගුරුවරුන් 241 ක් හා 243 ක් සඳහා නිල ඇඳුම් ප්‍රදානය කිරීමට කටයුතු කර නොතිබුණි. | මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කිසිදු වගකීමක් නොමැති බවත්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ වෙත නිල ඇඳුම් ගෙනවිත් භාරදීම සිදුවුවහොත් පමණක් එම නිල ඇඳුම් ප්‍රදානය සිදු කිරීම කරනු ලබන බව දන්වමි. | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් වරයාගේ අධීක්ෂණයට යටත් වන බැවින් නිරීක්ෂණයේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් වරයා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.9 වෙනත් නිරීක්ෂණ**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **Covid-19 වසංගත හේතුවෙන් සහනාධාර ගෙවීම.**<br><br>දිස්ත්‍රික් ලේකම් යටතේ පවතින දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් අංශවලින් Covid-19 වසංගතය හේතුවෙන් ජීවනෝපාය අහිමි වීම ඇතුළුව විවිධ වර්ගීකරණයන් යටතේ සහනාධාර ලබා දීම සම්බන්ධයෙන් සිදු කළ සෝදිසි පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය. | | |
| (අ) Covid-19 වසංගතය හේතුවෙන් මුදල් සහනාධාර ලබා දීම සඳහා 2020 මැයි මාසය අවසන් වන විට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හා ඒ යටතේ පිහිටුවා ඇති සමෘද්ධි බැංකු 68 ක් වෙත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් එවා තිබුණු මුළු මුදල රුපියල් මිලියන 2,382.65 ක් විය. ඉන් රුපියල් මිලියන 308.44 ක් ආපසු යවා තිබුණි. ඒ අනුව ශුද්ධ වශයෙන් ලැබී තිබුණු මුදල රුපියල් මිලියන 2,074 ක් වී තිබුණු අතර මුළු ගෙවීම් රුපියල් මිලියන 2,557.77 ක් වී තිබුණු බැවින් සමෘද්ධි බැංකු සංගම්වල අරමුදල් වලින් රුපියල් මිලියන 483.56 ක් ප්‍රතිලාභීන්ට ගෙවා තිබුණි. ඒ අනුව එම මුදල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතුව තිබුණි. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කර ගත යුතු මුදල රු.483,560,780 ක් විය යුතුය. | සමෘද්ධි බැංකු කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු රු.483,560,780ක් වූ මුදල කඩිනමින් ප්‍රතිපූර්ණය කරගත යුතු වේ. |
| (ආ) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 86 - ඕ ආඳාදොළ ග්‍රාම නිලධාරී වසමෙහි පුද්ගලයින් 17 දෙනෙක් සඳහා එක් වටයකදී රු.5,000 බැගින් පදනම් 02 ක් යටතේ එකතුව රු.170,000 ක් ගෙවා තිබූ බැවින් එම පුද්ගලයන් 17 දෙනාට පමණක් රු.85,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | ප්‍රතිලාභීන් හඳුනාගැනීමේදී ආබාධිත හා වැඩිහිටි මහලේකම් කාර්යාලවලින් ලබා දෙන ප්‍රතිලාභී හිමිකම සැලකිල්ලට නොගෙන කටයුතු කල යුතු බවට උපදෙස් ලබා දී ඇති බවත් ඒ අනුව ගෙවීම් කර ඇති බවත් දන්වමි. | covid ප්‍රතිලාභ ගෙවීම එක් පදනමක් තෝරාගෙන ඒ සඳහා පමණක් සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කඩවත්සතර හා අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව covid 19 යටතේ ප්‍රතිලාභ නොලැබීම සම්බන්ධයෙන් 2020 මැයි 01 දින සිට 2020 මැයි 27 දින දක්වා ලැබී තිබුණු අභියාචනා එකතුව 41 ක් සඳහා ගෙවීම් කිරීමට කමිටු නිර්දේශය ලැබී තිබුණු අතර 2021 අප්‍රේල් 30 දින වන විටත් දීමනා ගෙවා නොතිබුණි. | ගෙවීම් කිරීම සඳහා නිර්දේශය ලැබී තිබුණද ප්‍රතිපාදන හා මුදල් නොලැබීම හේතුවෙන් මේ වනතෙක් ගෙවීම් කර නැත. | සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්ට කාලීනව නියමිත covid ප්‍රතිලාභ ගෙවිය යුතු වේ. |
| (ඈ) | (i) ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් තලාපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ covid 19 ප්‍රතිලාභ ගෙවීමේදී අප්‍රේල් හා මැයි මාස වලදී ද්විත්ව පදනමක් මත පුද්ගලයන් 25 දෙනෙකුට ප්‍රතිලාභ ගෙවීම හේතුවෙන් එකතුව රු.250,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | 2019 වර්ෂයේ ඡන්ද හිමි නාම ලේඛන වල ඉහත සඳහන් 35 දෙනාගෙන් 10 දෙනෙකුගේ නම් ඇතුලත් වී ඇති බවත් ඒ පිළිබඳ විස්තර මේ සමඟ අමුණා ඇති ඇමුණුම් අංක 01 මඟින් ඉදිරිපත් කරන බවත් සඳහන් කර තිබුණි.එම ලේඛනයේ සඳහන් අනෙකුත් 25 දෙනාද 2019 ඡන්ද හිමි නාමලේඛනයේ සඳහන් නොවූවද, මෙම කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවන් වන බව දන්වමි. | covid ප්‍රතිලාභ ගෙවීම කිසියම් එක් පදනමක් තෝරාගෙන ඒ සඳහා පමණක් සිදු කළ යුතු වීම. |
| | (ii)වැඩිහිටි පොරොත්තු ලේඛනය යටතේ අප්‍රේල් මාසයේ මුදල් ගෙවීම් ලේඛනයේ සඳහන් පුද්ගලයන් 21 දෙනෙකුගේ හා මැයි මාසයේ පුද්ගලයන් 162 දෙනෙකුගේ වැඩිහිටි හැඳුනුම්පත් අංක සඳහන් නොකර රු.915,000 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති ප්‍රතිලාභීන් තෝරාගෙන ප්‍රතිලාභ ගෙවිය යුතු වීම. |
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 කට අදාළ විශ්‍රාම වැටුප් ලාභීන් 358 දෙනෙකුගේ ජීවන සහතිකය ලබානොගෙන 2020 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාළව වැටුප්ලාභීන් සිව්දෙනෙකුට 2019 වර්ෂයේ ඉදිරිපත් කරන ලද ජීවන සහතිකය පදනම් කරගෙන 2020 වර්ෂය සඳහාද විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි | මේ පිළිබඳ පසු විපරමක් සිදු කිරීමට කටයුතු කරමි. | සෑම විශ්‍රාමිකයකුටම අදාළව ජීවන සහතික ලබාගෙන ගොනුවට ඇතුළත් කළ යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු 186 ක් පැවති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු කර නොතිබුණි. | මෙම පුරප්පාඩු හා අතිරික්ත ඇතිවීම අපගේ කාර්යාලයේ පාලනයෙන් බාහිරව සිදු වී ඇති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහාත් අතිරික්තය තුලනය කර ගැනීම සඳහාත් ගතහැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. | අතවශ්‍යා තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත්කර පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 14 ක් බඳවාගෙන තිබුණි. | අප විසින් මෙම කිසිදු නිලධාරියෙකුගේ අතිරික්තයක් ඇති කිරීමට කටයුතු කර නොමැති නමුත් එම නිලධාරීන්ගේ විසින් කළ විවිධ අභියාචනා අනුව පත්වීම් බලධරයා විසින් මෙම නිලධාරීන් ගාල්ල දිස්ත්‍රික්කයේ කාර්යාලවලට අනුයුක්ත කර ඇත. | තනතුරු සඳහා බඳවා ගැනීමේදී අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා නොයන පරිදි බඳවා ගැනීම් කළ යුතු වේ. |
| (ඇ) | නිලධාරියෙකු නිත්‍ය රාජකාරියට පරිබාහිරව වෙනත් කාර්යයක් සඳහා නිදහස් කරන්නේ නම් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වන නමුත් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කර තිබුණු සමෘද්ධි නිලධාරියෙකු දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ සභාපති තනතුරට පත්කර තිබූ අතර ඒ සඳහා අනුමැතිය ලැබී තිබුණේ 2020 ජූලි 01 දින වූ බැවින් මාස 06 කට ආසන්න කාලයක් අනුමැතියකින් තොරව නිලධාරියා රාජකාරියේ නිරතව තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | ආයතන සංග්‍රහයේ විධි විධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත (ඇ) ඡේදයේ සඳහන් නිලධාරියා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිවිනැගුම සංවර්ධන නිලධාරී තනතුරෙහි පත්වීම් ලිපියේ කොන්දේසි නොසලකා හැර නිලධාරියාට නිත්‍ය තනතුරෙහි රාජකාරියට හිමි වැටුපට අමතරව දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ මාසික සභාපති දීමනාව, ඉන්ධන දීමනාව සමඟ දුරකථන දීමනාවක්ද වශයෙන් සංවර්ධන අධිකාරියේ සභාපති තනතුරට පත්වූ දින සිට 2020 ජුනි මාසය දක්වා අවිධිමත් පරිදි වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.654,729 ක් ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණ එකඟවෙන බව දන්වා තිබුණි. | හා පත්වීමේ ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |